# 10 ගැනුම් ජ'නලය, විකුණුම් ජ'නලය සහ පොදු ජ'නලය



මෙම පරිච්ඡේදය මගින් පහත දැක්වෙන කරුණු පිළිබඳ ව සාකච්ඡා කෙරේ.

10.1 ගැනුම් ජ'නලය
- ගැනුම් ජ'නලය පිළියෙල කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛන
- ගැනුම් ජ'නලයක සටහන් කළ ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම

10.2 විකුණුම් ජ'නලය
- විකුණුම් ජ'නලය පිළියෙල කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛන
- විකුණුම් ජ'නලයක සටහන් කළ ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම

10.3 පොදු ජ'නලය

10.4 තාක්ෂණික ක්‍රමවේද තුළින් සිදු කෙරෙන ක්ෂණික මුදල් ගනුදෙනු

## 10.1 ගැනුම් ජ'නලය

ව්‍යාපාරයක් නැවත විකිණීමේ පරමාර්ථයෙන් වෙළඳ භාණ්ඩ මිලදී ගනියි. මෙම භාණ්ඩ අත්පිට මුදලට හෝ ණය පදනම මත මිලදී ගත හැකි ය. ණය පදනම මත ලබා ගන්නා වෙළඳ භාණ්ඩ පිළිබඳ විස්තර වෙන ම ලේඛනයක සටහන් කර ගත යුතු ය. මේ සඳහා උපයෝගී කර ගන්නේ ගැනුම් ජ'නලයයි. මෙය දෛනික ගැනුම් පොත යනුවෙන් ද හැඳින්වේ.

වෙළඳ භාණ්ඩ ණයට ගැනීම පිළිබඳ තොරතුරු මුලින් ම සටහන් කරන පොත ගැනුම් ජ'නලය වේ.

**නිදසුන් :-**

- ලිපිද්‍රව්‍ය මිලට ගෙන නැවත විකිණීම සිදු කරන ව්‍යාපාරයක නම් ලිපි ද්‍රව්‍ය ණයට ගැනීම් ගැනුම් ජ'නලයේ සටහන් වේ.
- මෝටර් රථ මිලට ගෙන නැවත විකිණීම සිදු කරන ව්‍යාපාරයක මෝටර් රථ ණයට ගැනීම් ගැනුම් ජ'නලයේ සටහන් වේ.

භාණ්ඩ ණයට ගැනීමේ දී එම භාණ්ඩ සැපයීම සිදුකරන පාර්ශ්ව සැපයුම්කරුවන් හෙවත් වෙළඳ ණය හිමියෝ වෙති. ණය හිමියන්ට ගෙවිය යුතු ණය ව්‍යාපාරයේ වගකීම් වේ. සැපයුම්කරුවෝ ණයට භාණ්ඩ ලබා දීමේ දී ඊට අදාළ තොරතුරු සඳහන් කර මූලාශ්‍ර ලේඛනයක් ව්‍යාපාරයට එවති. එය **ඉන්වොයිසිය** නම් වේ. එය මිලට ගන්නා ව්‍යාපාරය පැත්තෙන් ගැනුම් ඉන්වොයිසිය ලෙස හැඳින්වෙයි. ගැනුම් ඉන්වොයිසිය පදනම් කරගෙන එම තොරතුරු ගැනුම් ජ'නලයේ ප්‍රථමයෙන් සටහන් කළ යුතු ය. ඉන් පසුව යම් කාලයකට වරක් එම ගනුදෙනු ලෙජරයට පිටපත් කරනු ලබයි.

ඉන්වොයිසියක ආකෘතියක් පහත දක්වේ. එය නිරීක්ෂණය කරන්න.

ඉන්වොයිසි අංකය 120

දේශාන් පොත් අලෙවිසල
මහ වීදිය
දෙහිවල

දුරකථනය :- 0112895942

කළමනාකරු
රශ්මි පොත්හල
මහරගම.

ඔබගේ අංක A/485 හා 20XX.02.01 දින දරන ඇණවුම අනුවයි.

| අනු අංකය | විස්තරය | ප්‍රමාණය | ඒකක මිල රු. | වටිනාකම රු. |
|---|---|---|---|---|
| | චිත්‍ර පොත් | 40 | 100 | 4 000 |
| | CR පොත් | 200 | 130 | 26 000 |
| | අභ්‍යාස පොත් | 120 | 60 | 7 200 |
| | | | | 37 200 |
| | අඩුකලා 10% ක වෙළඳ වට්ටම් | | | 3 720 |
| | | | | 33 480 |

(සියලු ම චෙක්පත් දේශාන් පොත් අලෙවිසල නමට ලියා රේඛනය කළ යුතු ය.)
කොන්දේසි : 5/30/ශුද්ධ 60

*නිර්මාල් පෙරේරා*
.......................................
කළමනාකරු



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ඉන්වොයිසියෙහි කොන්දේසි යටතේ 5/30/ශුද්ධ 60 යන්නෙන් අදහස් කරන්නේ දින 60ක් ඇතුළත ණය බේරුම් කළ යුතු බවත් දින 30ක් ඇතුළත බේරුම් කරන්නේ නම් 5%ක මුදල් වට්ටමක් ලබා දෙන බවත් ය.

භාණ්ඩ ණයට ගැනීමේ දී ලකුණු කළ මිලෙන් අඩු කෙරෙන ප්‍රමාණය වෙළඳ වට්ටම වේ. වෙළඳ වට්ටම ඉන්වොයිසියේ දී අඩුකෙරෙන අතර එය ගිණුම්ගත කෙරෙයි.

ඒ ඒ ඉන්වොයිසියේ ලකුණු කළ වටිනාකමින් වෙළඳ වට්ටම අඩුකළ පසු ලැබෙන **ශුද්ධ වටිනාකම** ගැනුම් ජ'නලයේ සටහන් කෙරෙයි.

ගැනුම් ජ'නලයක ආකෘතියක් පහත දැක්වේ. එය නිරීක්ෂණය කරන්න.

ගැනුම් ජ'නලය

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | මුළු වටිනාකම (රු.) | ලෙජර පිටුව |
|---|---|---|---|---|
| | | | | |

**නිදසුන් :-**

ලිපි ද්‍රව්‍ය මිලට ගෙන නැවත විකිණීම සිදුකෙරෙන ලිහිණිගේ ව්‍යාපාරයේ තොරතුරු පහත දැක්වේ.

20xx.03.01 ඉන්වොයිස් අංක 115 යටතේ නාමල්ගෙන් මිල දී ගත් භාණ්ඩවල ඉන්වොයිසියේ ශුද්ධ වටිනාකම රු. 22 000කි.

20xx.03.10 ඉන්වොයිස් අංක 65 යටතේ සහන්ගෙන් ගත් භාණ්ඩවල ශුද්ධ වටිනාකම රු. 28 000කි.

20xx.03.20 ඉන්වොයිස් අංක 43 යටතේ පූර්ණිමාගේ ව්‍යාපාරයෙන් ගත් භාණ්ඩවල ශුද්ධ වටිනාකම රු. 26 000කි.

20xx.03.25 ඉන්වොයිස් අංක 48 යටතේ පූර්ණිමාගේ ව්‍යාපාරයෙන් ගත් භාණ්ඩවල ශුද්ධ වටිනාකම රු. 12 000කි.

ගැනුම් ජ'නලය පිළියෙල කරන ආකාරය පහත දැක්වේ.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ගැනුම් ජ'නලය

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | මුළු වටිනාකම (රු.) | ලෙජර් පිටුව |
|---|---|---|---|---|
| 20XX.03.01 | 115 | නාමල් | 22 000 | |
| 03.10 | 65 | සහන් | 28 000 | |
| 03.20 | 43 | පූර්ණිමා | 26 000 | |
| 03.25 | 48 | පූර්ණිමා | 12 000 | |
| 03.31 | | ගැනුම් ගිණුමට හර කළා | 88 000 | |

**ගැනුම් ජ'නලයක සටහන් කළ ගනුදෙනු ලෙජරයට පිටපත් කරන ආකාරය**

ගැනුම් ජ'නලයේ එකතුව ලෙජරයේ ගැනුම් ගිණුමට හර කරනු ලැබේ. ඉන්පසු ඒ ඒ වටිනාකම් වෙන වෙන ම ගෙන අදාළ ණය හිමියන්ගේ ගිණුම්වලට බැර කළ යුතු ය. ගැනුම් ගිණුම සාමාන්‍යයෙන් වියදම් ගිණුමක් ලෙස සලකනු ලැබේ. මේ නිසා වියදම් ගිණුමක ගනුදෙනු සටහන් කිරීමේ රීතිය යොදා ගත යුතු ය.

වියදම් ගිණුමක වැඩිවීම සටහන් කරන්නේ එම ගිණුමේ හර පැත්තේ නිසා ගැනුම් ජ'නලයේ එකතුව ගැනුම් ගිණුමට හර කරනු ලැබේ. ණය හිමි ගිණුම් වගකීම් ගිණුම් වේ. ඒ නිසා වගකීම් වැඩිවීම බැර යන ද්විත්ව සටහන් රීතිය යටතේ ණය හිමි ගිණුම්වලට බැර කරනු ලැබේ.

ඒ අනුව ගැනුම් ජ'නලයේ සටහන් කළ අගය ලෙජරයට සටහන් කරන්නේ පහත සඳහන් පරිදි ය.

හර ගැනුම් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.31 | ණය හිමි | | 88 000 | | | | |

හර නාමල් බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු |
|---|---|---|---|---|---|---|---|
| | | | | 20XX.03.01 | ගැනුම් | | 22 000 |

හර සහන් බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු |
|---|---|---|---|---|---|---|---|
| | | | | 20XX.03.10 | ගැනුම් | | 28 000 |


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

හර      පූර්ණිමා      බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු |
|---|---|---|---|---|---|---|---|
| | | | | 20XX.03.20 | ගැනුම් | | 26 000 |
| | | | | 03.25 | ගැනුම් | | 12 000 |

## ක්‍රියාකාරකම 01

පහත තොරතුරුවලින් ඉන්දිකගේ ව්‍යාපාරයේ ගැනුම් ජ'නලය පිළියෙල කර ලෙජරයට පිටපත් කරන්න.

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | ඉන්වොයිසියේ සඳහන් ශුද්ධ වටිනාකම රු. |
|---|---|---|---|
| 20XX.05.06 | 82 | අමරනායක | 15 000 |
| 05.12 | 45 | විජේනායක | 18 000 |
| 05.20 | 36 | කරුණාරත්න | 34 000 |
| 05.26 | 73 | හේවාවසම් | 9 000 |
| 05.28 | 94 | අබේනායක | 20 000 |

## ක්‍රියාකාරකම 02

පහත සඳහන් තොරතුරුවලින් 20XX මැයි මාසය සඳහා සෙව්වන්දි ව්‍යාපාරයේ ගැනුම් ජ'නලය පිළියෙල කර 20XX.05.31 දිනට ලෙජරයට පිටපත් කරන්න.

| දිනය | ඉං. අංකය | සැපයුම්කරු | අනෙකුත් තොරතුරු |
|---|---|---|---|
| 20XX.05.06 | 65 | පියල් | එකක් රු.200 බැගින් රෝනියෝ කඩදාසි පැකට් 20 යි. (වෙළෙඳ වට්ටම 10%) |
| 20XX.05.12 | 38 | සුනිල් | එකක් රු. 250 බැගින් ඡායා පිටපත් කඩදසි පැකට් 30 යි. (වෙළෙඳ වට්ටම 5%) |
| 20XX.05.15 | 43 | රනිල් | එකක් රු. 400 බැගින් ගණක යන්ත්‍ර 30 යි. |
| 20XX.05.20 | 68 | පියල් | එකක් රු.240 බැගින් හාෆ්ෂීට් පැකට් 20 යි. (වෙළෙඳ වට්ටම 10%) |
| 20XX.05.28 | 40 | සුනිල් | එකක් රු. 400 බැගින් ගණක යන්ත්‍ර 20 යි. |

## 10.2 විකුණුම් ජ'නලය

**වයාපාරයක සිදු කෙරෙන වෙළඳ භාණ්ඩ ණයට විකුණූ විට එම ගනුදෙනුව ප්‍රථම වරට සටහන් කරන පොත විකුණුම් ජ'නලය නම් වේ.**

භාණ්ඩ ණයට විකිණීමේ දී ණය ගැතියන් වෙත ඉන්වොයිසියක් නිකුත් කෙරෙයි. එය විකුණුම් ඉන්වොයිසිය ලෙස හැඳින්වෙයි. මෙහි පිටපතක් ව්‍යාපාරය තුළ තබා ගැනේ. විකුණුම් ජ'නලයෙහි ගනුදෙනු සටහන් කරන්නේ මෙම විකුණුම් ඉන්වොයිසි පිටපත මූලාශ්‍ර ලේඛනය ලෙස යොදා ගෙන ය.

භාණ්ඩ ණයට විකිණීමේ දී ද ඉන්වොයිසියේ සඳහන් කළ ලකුණු කළ මිලෙන් යම් ප්‍රතිශතයක් අඩු කෙරෙයි. මෙය වෙළඳ වට්ටම් වේ. වෙළඳ වට්ටම අඩු කළ පසු ලැබෙන ශුද්ධ වටිනාකම විකුණුම් ජ'නලයේ සටහන් කරයි. විකුණුම් ජ'නලයේ සටහන කරන ගනු දෙනු යම් කාලසීමාවක් අවසානයේ දී ලෙජරයට පිටපත් කරනු ලැබේ.

**නිදසුන් ඃ-**

පාරිභෝගික භාණ්ඩ මිලට ගෙන අලෙවි කිරීමේ කටයුතුවල යෙදෙන අමරසිංහගේ ව්‍යාපාරය විසින් නිකුත් කරන ලද ඉන්වොයිසිවල ශුද්ධ අගයන් පහත පරිදි වේ.

| දිනය | ඉ. අංකය | ගැනුම්කරු | වටිනාකම |
|---|---|---|---|
| 20XX.05.02 | 35 | රත්න | 5 000 |
| 05.08 | 36 | කුමාර | 12 000 |
| 05.10 | 37 | රත්න | 8 000 |
| 05.21 | 38 | මහානාම | 13 000 |
| 05.23 | 39 | ඉන්දික | 17 000 |
| 05.25 | 40 | මහානාම | 6 000 |
| 05.28 | 41 | ඉන්දික | 7 000 |

20XX.05.31 න් අවසන් වූ මාසය සඳහා විකුණුම් ජ'නලය පිළියෙල කිරීම හා ලෙජරයට පිටපත් කිරීම පහත දැක්වේ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

විකුණුම් ජ'නලය

| දිනය | ඉ. අංකය | ගැනුම්කරු | මුළු වටිනාකම (රු.) | ලෙජර් පිටුව |
|---|---|---|---|---|
| 20XX.05.02 | 35 | රත්න | 5 000 | |
| 05.08 | 36 | කුමාර | 12 000 | |
| 05.10 | 37 | රත්න | 8 000 | |
| 05.21 | 38 | මහානාම | 13 000 | |
| 05.23 | 39 | ඉන්දික | 17 000 | |
| 05.25 | 40 | මහානාම | 6 000 | |
| 05.28 | 41 | ඉන්දික | 7 000 | |
| 05.31 විකුණුම් ගිණුමට බැර කළා | | | 68 000 | |

හර විකුණුම් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු |
|---|---|---|---|---|---|---|---|
| | | | | 20XX.05.31 | ණය ගැති | | 68 000 |

හර රත්න බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු |
|---|---|---|---|---|---|---|---|
| 20XX.05.02 | විකුණුම් | | 5 000 | | | | |
| 05.10 | විකුණුම් | | 8 000 | | | | |

හර කුමාර බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු |
|---|---|---|---|---|---|---|---|
| 20XX.05.08 | විකුණුම් | | 12 000 | | | | |

හර මහානාම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු |
|---|---|---|---|---|---|---|---|
| 20XX.05.21 | විකුණුම් | | 13 000 | | | | |
| 05.25 | විකුණුම් | | 6 000 | | | | |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

| හර | | | ඉන්දික | | | | බැර |
|---|---|---|---|---|---|---|---|
| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු |
| 20XX.05.23 | විකුණුම් | | 17 000 | | | | |
| 05.28 | විකුණුම් | | 7 000 | | | | |



### ක්‍රියාකාරකම 03

නිර්මලීගේ ව්‍යාපාරයේ මූලාශ්‍ර ගොනුව පහත දැක්වේ.

නිර්මලීගේ ව්‍යාපාරය
මහරගම.

ගයාෂාන් සෙන්ටර්, — අංකය :- 1820
නුගේගොඩ. — දිනය :- 20XX.03.02

ඉන්වොයිසිය

| අනු අංකය | භාණ්ඩවල විස්තර | ප්‍රමාණය | ඒකක මිල රු. | වටිනාකම රු. |
|---|---|---|---|---|
| 01 | රූපවාහිනී යන්ත්‍ර | 10 | 15 000 | 150 000 |
| 02 | පරිගණක යන්ත්‍ර | 10 | 30 000 | 300 000 |
| | | | | 450 000 |
| | අඩුකළා - වට්ටම 10% | | | 45 000 |
| | | | | 405 000 |

20XX.04.30 ට පෙර මුදල් ගෙවන්නේ නම් වට්ටම 4% කි.

*සුදේෂ් කරුණාතිලක*
.......................................
විකුණුම් කළමනාකරු



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

නිර්මලීගේ ව්‍යාපාරය
මහරගම.

නිලුෂාන් සෙන්ටර්, අංකය :- 1821
දෙහිවල. දිනය :- 20XX.03.16

ඉන්වොයිසිය

| අනු අංකය | භාණ්ඩවල විස්තර | ප්‍රමාණය | ඒකක මිල රු. | වටිනාකම රු. |
|---|---|---|---|---|
| 01 | කැසට් යන්ත්‍ර | 20 | 3 000 | 60 000 |
| 02 | ගුවන්විදුලි යන්ත්‍ර | 30 | 2 000 | 60 000 |
| | | | | 120 000 |
| | අඩුකළා - වට්ටම 5% | | | 6 000 |
| | | | | 114 000 |

20xx.04.30 ට පෙර මුදල් ගෙවන්නේ නම් වට්ටම 4% කි.

සුදේෂ් කරුණාතිලක
...................................
විකුණුම් කළමනාකරු

නිර්මලීගේ ව්‍යාපාරය
මහරගම.

දිල්ෂාන් සෙන්ටර්, අංකය :- 1822
දික්වැල්ල. දිනය :- 20xx.03.18

ඉන්වොයිසිය

| අනු අංකය | භාණ්ඩවල විස්තර | ප්‍රමාණය | ඒකක මිල රු. | වටිනාකම රු. |
|---|---|---|---|---|
| 01 | ඡායාපිටපත් යන්ත්‍ර | 08 | 50 000 | 400 000 |
| 02 | රූපවාහිනී යන්ත්‍ර | 10 | 20 000 | 200 000 |
| | | | | 600 000 |

20xx.04.30 ට පෙර මුදල් ගෙවන්නේ නම් වට්ටම 4% කි.

සුදේෂ් කරුණාතිලක
...................................
විකුණුම් කළමනාකරු

අවශ්‍ය වන්නේ,

01. පහත සඳහන් ආකෘතියට අනුව විකුණුම් ජ'නලය පිළියෙල කිරීම

| දිනය | ඉන්වොයිස් අංකය | ගනුදෙනුකරු | මුළු වටිනාකම | ලෙජර පිටුව |
| --- | --- | --- | --- | --- |
| | | | | |

02. අදළ ලෙජර ගිණුම් පිළියෙල කිරීම

## 10.3 පොදු ජ'නලය

ව්‍යාපාරයක එදිනෙද සිදුවන ගනුදෙනු මුදල් පොත, සුළු මුදල් පොත, ගැනුම් ජ'නලය සහ විකුණුම් ජ'නලය යනාදී මූලික පොත්වල සටහන් කරන ආකාරය ඉහත දී සාකච්ඡා කරන ලදී. මෙම මූලික සටහන් පොත් විශේෂ ගනුදෙනු වර්ගයක් සටහන් කිරීම වෙනුවෙන් භාවිත කරන පොත් බැවින් මේවා විශේෂ ජර්නල් ලෙස ද හඳුන්වනු ලැබේ.

**නිදසුන් ෲ-**

විකුණුම් ජ'නලය භාවිත කරන්නේ වෙළඳ භාණ්ඩ ණයට විකුණුම් සටහන් කිරීම සඳහා පමණක් වීම

එම පොත්වල සටහන් කරන ගනුදෙනු වර්ගවලට අමතර ව වෙනත් ගනුදෙනු ද සිදුවිය හැකි ය. ඒවා ඉහත සඳහන් කළ මූලික සටහන් පොත්වල සටහන් කළ නොහැකි ය.

**නිදසුන් ෲ-**

- ව්‍යාපාරයේ පාවිච්චිය සඳහා යන්ත්‍රයක් ණය පදනම මත ලබා ගැනීම
- ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම සඳහා ඉඩමක් ණය පදනම මත ලබා ගැනීම
- අයිතිකරු විසින් වෙළඳ භාණ්ඩ තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගැනීම

එවැනි ගනුදෙනු සටහන් කිරීමට වෙනම ම මූලික පොතක් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. එම ගනුදෙනු සටහන් කරන මූලික පොත පොදු ජ'නලය ලෙස හැඳින්වේ. ඒ අනුව **අනෙකුත් උපයෝගී පොත්වල සටහන් නොවන ගනුදෙනු මුලින් ම සටහන් කරන පොත පොදු ජ'නලය වේ.**


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

පොදු ජ'නලයක ගනුදෙනු සටහන් කිරීමේ දී මූලාශ්‍ර ලේඛනය ලෙස භාවිත කරනුයේ **ජ'නල් වවුචරයයි.** පොදු ජ'නලයක් පහත දැක්වෙන පරිදි පිළියෙල කළ හැකි ය.

පොදු ජ'නලය

| දිනය | වවුචර අංකය | විස්තරය | ලෙ.පි | හර රු. | බැර රු. |
|---|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) | (6) |

(1) ගනුදෙනුව සිදු වූ දිනය
(2) ජ'නල් වවුචරයේ අංකය
(3) හර හා බැර වන ගිණුම් සහ සංලක්ෂය
(4) ලෙජරයේ අදළ ගිණුමේ ඇති පිටු අංකය
(5) සහ (6) ගනුදෙනුවේ වටිනාකම

පොදු ජ'නලයේ සටහන් කරනු ලබන සෑම ගනුදෙනුවකට ම අදළ කෙටි විස්තරයක් (ද්විත්ව සටහන සමග) ලියනු ලබන අතර එය සංලක්ෂය ලෙස හැඳින්වේ.

**නිදසුන :-**

20xx.02.28 දින ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 10 000ක් වටිනා උපකරණ සීමාසහිත සිල්වා සහ සමාගමෙන් ණයට ගැනීම

පොදු ජ'නලය

| දිනය | වවුචර අංකය | විස්තරය | ලෙ.පි | හර රු. | බැර රු. |
|---|---|---|---|---|---|
| 20xx.02.28 | | උපකරණ ගිණුම (හර)<br>සිල්වා සහ සමාගම<br><br>(20xx.02.28 දින සිල්වා සහ සමාගමෙන් රු. 10 000ක් වටිනා උපකරණ ණයට ගැනීම සටහන් කිරීම) | | 10 000 | 10 000 |

පොදු ජ'නලයක තබන සටහන් වර්ග කිහිපයක් ඇත. ඒවා අතරින් වැරදි නිවැරදි කිරීමේ සටහන් සහ ගැළපුම් සටහන් පිළිබඳ අධ්‍යයනය කළ හැකි වන අතර පොදු ජ'නලයෙහි තබන අනෙකුත් සටහන් වර්ග පිළිබඳ ව අධ්‍යයනය කිරීම සාමාන්‍ය පෙළ මට්ටමේ දී අපේක්ෂා නොකෙරේ.

## 10.4 තාක්ෂණික ක්‍රමවේද තුළින් සිදු කෙරෙන ක්ෂණික මුදල් ගනුදෙනු

ව්‍යාපාරික කටයුතු සිදු කෙරෙන ආකාරය තාක්ෂණයේ දියුණුවත් සමග වෙනස් වී තිබේ. එනම් වර්තමානයේ දී බොහෝ ව්‍යාපාර සිය ගනුදෙනු තාක්ෂණික ක්‍රම ඔස්සේ සිදු කිරීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. මෙසේ තාක්ෂණය භාවිත කරමින් සිදු කෙරෙන ව්‍යාපාර කටයුතු කිහිපයක් පහත දැක්වේ.

- ගනුදෙනු පොත්වල සටහන් කිරීම වෙනුවට පරිගණක ආශ්‍රයෙන් සටහන් කිරීම
- ගනුදෙනුකරුවන් හා සැපයුම්කරුවන් වෙත ලිපි මගින් පණිවිඩ හුවමාරු කිරීම වෙනුවට දුරකථන භාවිත කිරීම, කෙටි පණිවිඩ සේවා භාවිත කිරීම හා විද්‍යුත් තැපෑල භාවිත කිරීම
- ව්‍යාපාරයේ ජල බිල්පත්, දුරකථන බිල්පත් ආදිය සඳහා අන්තර්ජාලය හරහා මුදල් ගෙවීම
- කාසි හා නෝට්ටු වෙනුවට චෙක්පත්, හරපත්, ණයපත් ආදිය භාවිත කිරීම
- බැංකුව වෙත නොගොස් අන්තර්ජාලය ඔස්සේ බැංකුව සමග අවශ්‍ය ගනුදෙනු කිරීම, බැංකු ගිණුම් විස්තර ලබා ගැනීම
- Point of sale වැනි ඉලෙක්ට්‍රොනික උපකරණ භාවිත කරමින් විකුණුම් කටයුතු සිදු කිරීම

තාක්ෂණය භාවිත කරමින් සිදුවන මෙවැනි ගනුදෙනු ද ව්‍යාපාරයේ මූලික පොත්වල සටහන් කර ලෙජරයට පිටපත් කළ යුතු වේ.

### ජංගම දුරකථන ආශ්‍රිත ගනුදෙනු

ශ්‍රී ලංකාව පුරා සියලු ප්‍රදේශ ආවරණය කරමින් ව්‍යාප්ත ව පවතින ජංගම දුරකථන සේවය අද සෑම දෙනාගේ ම දෛනික කටයුතුවල විශාල පෙරළියක් සිදු කර ඇත. නවීනතම තාක්ෂණයෙන් යුක්ත වන ජංගම දුරකථන ව්‍යාපාර ලෝකයේ ද බොහෝ වෙනස්කම් සිදු කර ඇත.

ශ්‍රී ලංකාව තුළ ඉතා ඉහළ මට්ටමකින් ව්‍යාප්ත ව පවත්නා ජංගම දුරකථන භාවිත කරමින් ගෙවීම් කටයුතු කිරීම අද බොහෝ ව්‍යාපාරවල බහුල ව දක්නට ලැබේ. 2012 වසරේ දී පෞද්ගලික දුරකථන ජාල ක්‍රියාකරුවෙකු විසින් ප්‍රථම වරට ජංගම දුරකථන ආශ්‍රිත ව ගෙවීම් ක්‍රමය ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදි.



රූපය 10.1



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ජංගම දුරකථන භාවිත කිරීම ව්‍යාපාරික කටයුතුවලට පහසුවකි. ඉන් කිහිපයක් පහත දැක්වේ.

- ව්‍යාපාරයට සම්බන්ධ ඕනෑ ම පාර්ශ්වයක් සමග ඉතා ඉක්මණින් තොරතුරු සන්නිවේදනය කළ හැකි වීම.
- ජංගම දුරකථන හරහා බැංකු කටයුතු පහසුවෙන් ඉටුකර ගත හැකි වීම.
- ජංගම දුරකථන දත්ත සන්නිවේදන ජාලය හරහා ව්‍යාපාරිකයෙකුට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු අන්තර්ජාලයට පිවිස පහසුවෙන් ලබා ගත හැකි වීම.

වර්තමානයේ බොහෝ වාණිජ බැංකු තම ගනුදෙනුකරුවන් වෙත දුරකථන බැංකු සේවා පහසුකම් ලබා දී ඇත. ටෙලි බැංකු සේවා ලෙස හඳුන්වන්නේ මේවා ය. මේ තුළින් ව්‍යාපාරිකයෙකුට පහත සඳහන් කාර්ය ඉටුකර ගත හැකි වේ.


- බැංකු ගිණුමේ ශේෂය පිරික්සීම
- බැංකු ගිණුම් ප්‍රකාශන ලබා ගත හැකි වීම
- විදුලි බිල්පත්, ජල බිල්පත් ආදිය ගෙවීම
- ගිණුමකින් තවත් ගිණුමකට මුදල් මාරු කිරීම
- චෙක්පොත් සඳහා අයදුම් කිරීම

ජංගම දුරකථන බැංකුකරණයේ වාසි

- ඕනෑ ම අවස්ථාවක, ඕනෑ ම ස්ථානයක සිට වුව ද බැංකුවට නොගොස් ව්‍යාපාරිකයෙකුට තම මුදල් පාලනය කළ හැකි වීම
- ගනුදෙනු කිරීම පහසු වීම
- මූල්‍යමය ගනුදෙනු ඉතා ඉක්මණින් සපුරා ගත හැකි වීම
- කාලය හා ශ්‍රමය ඉතිරි වීම
- මුදල් කාසි හා නෝට්ටු වශයෙන් එහා මෙහා ගෙන යෑමේ දී ආරක්ෂාව සම්බන්ධයෙන් මතුවන ගැටලු ජංගම දුරකථන බැංකුකරණයේ දී ඇති නොවීම

## පරිගණක ආශ්‍රිත ගිණුම්කරණය

වර්තමානයේ බොහෝ ව්‍යාපාර සංවිධාන ඒවායේ ගිණුම්කරණ කටයුතු පරිගණක ගත කර ඇත. මෙහි දී සිදු වන්නේ ව්‍යාපාරයේ ගිණුම්කරණ දත්ත පරිගණක මෘදුකාංගයක් (Software) වෙත ඇතුළත් කිරීම තුළින් අවශ්‍ය ගිණුම්කරණ නිමැවුම් ලබා ගැනීම යි. ව්‍යාපාරයේ දෛනික ව සිදුවන ගනුදෙනු පරිගණක පද්ධතියට ඇතුළත් කරනු ලබන අතර ඒවා වාර්තා කිරීම, ගබඩා කිරීම හා විශ්ලේෂණය තුළින් ව්‍යාපාර කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශ්ව වෙත අවශ්‍ය තොරතුරු ලබාදීම පරිගණකය මගින් සිදු කෙරෙයි.




රූපය 10.2

ගිණුම් කාලච්ඡේදය අවසානයේ දී, ව්‍යාපාරයේ මූල්‍ය වාර්තා පරිගණකය මගින් ස්වයංක්‍රිය ව පිළියෙල කෙරෙයි. වර්තමානයේ දි පහත සඳහන් ගිණුම්කරණ මෘදුකාංග පැකේජ භාවිතයේ පවති.

- Acc pac
- Quickbook
- MYOB
- Sage

පරිගණක ආශ්‍රිත ගිණුම්කරණයේ වාසි සහ අවාසි පහත දක්වා ඇත.

වාසි :-

- ඉක්මනින් ගනුදෙනු ගිණුම් ගත කිරීමට හා අවශ්‍ය ගිණුම් වාර්තා ස්වයංක්‍රිය ව පිළියෙල කරගැනීමට හැකි වීම නිසා කාලය ඉතිරි වීම
- අවශ්‍ය ශ්‍රමය අවම වීම තුළින් මුදල් ඉතිරි වීම
- ස්වයංක්‍රිය ව නිමවන ගිණුම් වාර්තාවල නිරවද්‍යතාව ඉහළ වීම
- කාලීන දත්ත පහසුවෙන් ලබා ගත හැකි වීම

අවාසි :-

- විදුලිය ඇණ හිටීම, පරිගණක වෛරස හා අනෙකුත් තාක්ෂණික දෝෂ නිසා දත්ත නැති වීමේ අවදානම
- පරිගණක දත්ත ලබා ගැනීමේ හා වෙනස් කිරීමේ අවදානමක් තිබීම
- අවශ්‍ය පරිගණක මෘදුකාංගය මිල දී ගැනීම සඳහා විශාල මුදලක් ගෙවිය යුතු වීම



***ක්‍රියාකාරකම 04***

01. ජංගම දුරකථන බැංකුකරණයේ වාසි කිහිපයක් දක්වන්න.

02. ගනුදෙනු පොත්වල සටහන් කිරීමට වඩා පරිගණක ආශ්‍රයෙන් සටහන් කිරීම ව්‍යාපාරයකට හිතකර විය හැකි ය. මෙම ප්‍රකාශය සම්බන්ධ ව තම මිතුරන් සමග විවාදයක යෙදෙන්න.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.